සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2021-03-21
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් (main functions) වන්නේ:

(1) සැලසුම්කරණය, අණදීමේ ඒකීයතාවය, අභිප්‍රේරණය සහ මෙහෙයවීම.

(2) සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම සහ පාලනය.

(3) සැලසුම්කරණය, තීරණ ගැනීම, සන්නිවේදනය සහ මෙහෙයවීම.

(4) සැලසුම්කරණය, සඵලදායීත්වය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, සැලසුම්කරණයේ මූලධර්මයක් **නොවන්නේ** කුමක් ද?

(1) නම්‍යතාවය පිළිබඳ මූලධර්මය.

(2) කණ්ඩායමක් ලෙස වැඩ කිරීම පිළිබඳ මූලධර්මය.

(3) බලපෑම් කිරීම පිළිබඳ මූලධර්මය.

(4) සංකීර්ණත්වය පිළිබඳ මූලධර්මය.

**1.3** පෝටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) උපකාරක ක්‍රියාකාරකමක් වන්නේ:

(1) මෙහෙයුම්.

(2) ආයතනික යටිතල පහසුකම්.

(3) ද්‍රව්‍ය මිලදී ගැනීම.

(4) සේවා.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රතිලාභයන් (rewards) හි අභ්‍යන්තර තීරකයක් වන්නේ කුමක් ද?

(1) ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන්. (2) රැකියාවේ වටිනාකම.

(3) ජීවන වියදම. (4) රජයේ ප්‍රතිපත්තිය.

1.5 පහත සඳහන් ඒවා පිළිබඳව සලකා බලන්න:

**(a)** නිවසේ සිට වැඩ කිරීම (Work from home).

**(b)** සේවකයන් බාහිරින් ලබා ගැනීම (Employees' outsourcing).

**(c)** රැකියාව සහ පවුල් ජීවිතය අතර සමබරතාවය (Work life balance).

ඉහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයට අදාල නිවැරදි නවෝත්පාදනය / නවෝත්පාදන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.6 සංවිධානයේ උපායමාර්ගයට බලපෑම් කරන …………………… *(අභ්‍යන්තර / බාහිර)* සාධකයක් ලෙස සංවිධානමය සංස්කෘතිය හඳුනාගත හැකිය.

1.7 …………………… *(අධිකාරිත්වය / වගකීම)* ඉහළ සිට පහළට ගලා යයි.

1.8 සේවකයෙකුගේ …………………… *[වර්ධනය (growth) / පිළිගැනීම (recognition)]* අවශ්‍යතා ධූරාවලි න්‍යායයේ (Hierarchy of Needs theory) මමත්ව / සම්මානනීය (esteem) අවශ්‍යතාවයකට උදාහරණයකි.

1.9 …………………… *(තෝරාගැනීම / අනුස්ථාපනය)* යනු නව සේවකයා සංවිධානයට හඳුන්වාදීමේ සහ හුරු පුරුදු කිරීමේ ක්‍රියාවලිය වේ.

1.10 …………………… *(අධ්‍යාපන සුදුසුකම් / ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන්)* යනු රැකියා විස්තරයේ [Job Description (JD)] අංගයක් වේ. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 කණ්ඩායම් තීරණ ගැනීම්වල වාසි දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.12 සැපයුම් දාම (Supply chain) කළමනාකරණයේ මූලිකාංග (elements) දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.13 මානව සම්පත් කළමනාකරණයේ [Human Resource Management (HRM)] අරමුණු (objectives) දෙකක්(02) සඳහන් කරන්න.

1.14 සංවිධානයක සේවක දුක්ගැනිවිලි (grievances) ඇතිවීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

1.15 ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිඉංජිනේරුකරණයේ [Business Process Re-engineering (BPR)] ලක්ෂණ (characteristics) දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

ව්‍යාපාර පරිසරය බෙහෙවින් වෙනස්වන සුළු වන අතර, සෑම ව්‍යාපාරික ආයතනයකටම ගතික පරිසරයේ වෙනස්වීම්වලට මුහුණදීමට සිදුවේ. එබැවින් කළමනාකරුවන් විසින් අභියෝගයන්ට මුහුණ දීම සඳහා ඔවුන්ගේ චින්තනයේ නව්‍යතාවයක් ඇතිකර ගත යුතුවේ. කළමනාකරණ චින්තනය වසර ගණනාවක් තිස්සේ ව්‍යාපාර පරිසරය තුළ සිදුවෙමින් පවතින සමාජ, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික වෙනස්කම්වලට අනුකූලව අඛණ්ඩව වෙනස් වෙමින් පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නිලතන්ත්‍රවාදී කළමනාකරණ න්‍යායයේ (Bureaucratic Management Theory) ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) කළමනාකරුවෙකු සතු විය යුතු කුසලතා (skills) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) කොවිඩ්-19 (COVID-19) ගෝලීය වසංගතය හේතුකොටගෙන කළමනාකරණයේ ඇතිවූ නව ප්‍රවණතා (new trends) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**සීමාසහිත XYZ සමාගමේ** නිෂ්පාදන කළමනාකරු විසින් සැලසුම්කරණය කිරීම නිශ්ඵල කාර්යයක් බව තර්ක කරන ලදී. මන්ද, පසුගිය වර්ෂ කිහිපය තුළ ඔවුන් විසින් සංවර්ධනය කළ සියලුම සැලසුම් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර නොගත් බැවිනි. අදාල සියලු සාධක විශ්ලේෂණය කොට සියලු සැලසුම් යථාර්ථවාදීව (realistic) සැකසිය යුතු බව **සීමාසහිත XYZ සමාගමේ** ප්‍රධාන විධායක නිලධාරීවරයා කළමනාකරණ රැස්වීමේදී උපදෙස් දුන් අතර, තීරණ ගැනීම වඩාත් තාර්කික විය යුතු යැයි යෝජනා කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවරයන් (steps) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සංවිධානයකට සැලසුම්කරණය වැදගත් වන්නේ ඇයි ද යන්නට හේතු (reasons) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(c) **සීමාසහිත XYZ සමාගමේ** නිෂ්පාදන කළමනාකරු විසින් සකස් කරන ලද සැලසුම් අසාර්ථක වීම කෙරෙහි බලපෑ හැකි හේතු (reasons) දෙකක්(02) **සඳහන් කරන්න** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

මෙහෙයුම් කළමනාකරණය සංවිධානයේ වැදගත් කාර්යයක් වන අතර, එය සංවිධානයේ එදිනෙදා කටයුතු සඵලදායිව සහ කාර්යක්ෂමව ඉදිරියට කරගෙන යාමට උපකාරී වේ. ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සුමටව සිදුකිරීම සඳහා අධිකාරිත්වය නිසියාකාරව පැවරීම අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මෙහෙයුම් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් (key functions) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) වර්තමානයේ මෙහෙයුම් කළමනාකරණය සඳහා භාවිත කරන නව තාක්ෂණයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) අධිකාරී බලය පැවරීමේ (delegation of authority) වාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

කොවිඩ්-19 (COVID-19) වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් නිකුත් කරන ලද නව සෞඛ්‍ය මාර්ගෝපදේශ මගින් සංවිධානයන් තුළ නව පාලන මාලාවක් නිර්මාණය වී ඇත. එබැවින් මෙම පාලනයන් පිළිබඳව තම කාර්යමණ්ඩලය දැනුවත් කිරීම සඳහා කළමනාකරුවන් විසින් විවිධ සන්නිවේදන ක්‍රමවේදයන් භාවිත කිරීමට මඟ පාදනු ලැබේ. එනමුදු එම මාර්ගෝපදේශයන් අදාළ සංවිධානයන් විසින් කාර්ය මණ්ඩලය වෙත සඵලදායී ලෙස සන්නිවේදනය කර නොමැති බැවින් බොහෝ සංවිධානවල සමහර සේවකයන් මෙම මාර්ගෝපදේශ පිළිනොපදිනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සඵලදායී සන්නිවේදනය (effective communication) තුළින් සංවිධානයකට ලබාගත හැකි ප්‍රතිලාභ (benefits) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(b) පාලන ක්‍රියාවලියක ප්‍රධාන පියවරයන් (main steps) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) නව සෞඛ්‍ය මාර්ගෝපදේශයන් හේතුවෙන් ආයතනයක් විසින් පාලනයේදී සැලකා බැලිය යුතු සාධක (factors) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

අලෙවිකරණය සංවිධානයක ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සංවිධානයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය එය භාවිත කරනු ලබන අලෙවිකරණ ශිල්පීය ක්‍රමවල ගුණාත්මකභාවය මත රඳා පවතී. එබැවින්, සංවිධානයක උපායමාර්ග සංවර්ධනය කිරීමේදී සංවිධාන සිය අලෙවිකරණ කටයුතු නිසිලෙස හැසිරවිය යුතුය. බොහෝ සංවිධාන ප්‍රධාන අලෙවිකරණ ක්‍රියාකාරකමක් ලෙස ඔවුන්ගේ "සන්නාමීකරණය" (branding) සඳහා වැඩි ප්‍රවණතාවයක් ලබාදේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් (4Ps) හතර(04) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සාර්ථක සන්නාමක (brand) අවශ්‍යතාවයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ව්‍යාපාර සංවිධානයකට සන්නාමීකරණය වැදගත්වීමට හේතු (reasons) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**සුසන්ත,** මැටි බඩු (කුඹල්) ව්‍යාපාරිකයෙක් වන අතර, ඔහුට මෙම ව්‍යාපාරය සිය පියාගෙන් උරුම වී ඇත. ඔහු තම සාම්ප්‍රදායික ව්‍යාපාරය යම් මට්ටමකට සාර්ථක කර ගැනීමට සමත් වී ඇත. සියලුම අලෙවිකරණ කටයුතු ඔහු විසින් පමණක් සිදුකරනු ලබන අතර, මේ සඳහා සිය පෞද්ගලික සම්බන්ධකම් උපයෝගී කර ගනී. ඔහුගේ ව්‍යාපාරය සඳහා අන්තර්ජාලය හරහා මාර්ගගත වේදිකාවක් (online platform) ස්ථාපිත කිරීමට ඔහු විසින් සැලසුම් කරමින් සිටී. නමුත් ඔවුන්ගේ ව්‍යාපාරය සඳහා ඉහළ තාක්ෂණය යොදාගැනීම සම්බන්ධයෙන් **සුසන්තගේ** පියාට, **සුසන්ත** සමඟ එකඟතාවයක් නොතිබුණි.

ව්‍යාපාරයට උපායමාර්ගික සැලැස්මක් හඳුන්වාදීම සඳහා **සුසන්ත** විසින් මූලික පියවර ගෙන තිබෙන අතර, ඔහුගේ උපායමාර්ගය වන්නේ මෙම ව්‍යාපාරය "ඇණවුම් මත නිෂ්පාදන" සිදුකරන ව්‍යාපාරයක් ලෙස යොමුකිරීම වේ. විද්‍යුත් වාණිජ්‍යය (E-commerce) සහ සමාජ මාධ්‍ය **සුසන්ත** විසින් හඳුන්වාදීමට සැලසුම් කර ඇති නව්‍යතාවයන් කිහිපයකි.

**සුසන්ත** විසින්, සැලසුම්කරන ලද වෙනස්කම් නිසා දිනපතා පඩි ලබන කම්කරුවන්ගේ රැකියා අහිමිවීමේ ඉහළ අවධානමක් නිර්මාණය වී ඇත. තවද, ඇඩි කැපවීමෙන් යුතුව සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ සේවකයින් කිප දෙනෙක් මෙම වෙනස්කම් පිළිබඳව නොසතුටින් පසුවේ. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ද මූලික පියවර ගෙන ඇති හෙයින් නව ඉල්ලුම සපුරාලීම සඳහා පුහුණු සේවකයින් බඳවා ගැනීම සඳහා **සුසන්ත** සැලසුම් කරමින් සිටී.

සේවකයන් වෙනස්වීම සඳහා විරුද්ධ බැවින් නව වෙනස්කම් සහ එම වෙනස්කම් අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳව දැනුවත් කිරීම සඳහා සියලු කාර්ය මණ්ඩලය ඉලක්ක කර වැඩමුළුවක් පැවැත්වීමට **සුසන්ත** තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සුසන්තගේ** ව්‍යාපාරය සඳහා ඩිජිටල් අලෙවිකරණය භාවිත කළ හැකි ආකාර (ways) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) සිය ව්‍යාපාරය සඳහා උපායමාර්ගික සැලැසුමක් සංවර්ධනය කිරීමේදී **සුසන්තට** පාරිසරික විශ්ලේෂණය සලකා බැලිය හැකි ආකාරය, PESTEL විශ්ලේෂණය භාවිතයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(c) මානව සම්පත් අතිරික්තය වළක්වා ගැනීම සඳහා උපායමාර්ග (strategies) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(d) වෙනසට ප්‍රතිරෝධය / බාධක (resistance to change) මැඩ පැවැත්වීමට **සුසන්තට** භාවිත කළ හැකි ක්‍රම (ways) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(e) නූතන සාර්ථක නායකයෙකුගේ ලක්ෂණ (characteristics) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව |

| | | | |
|---|---|---|---|
| | | | පරීක්ෂා කරන්න. |